# සිංහ

## 2004

### ජන - ශ්‍රැති කලාපය

ප්‍රකාශනය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

# අප්ටනාරි සන්දේසය

- (පුරාණ) -

කේ. බී. හේරත් කවිවරයා විසින්
ඌනපූරණයෙන් සකස් කරණ ලදී.

ඇම්. ඩී. දාම්පි අප්පුහාමි විසින්
ශාස්ත්‍රාධාර යන්ත්‍රාලයෙහි අච්චුගස්වන ලදී.
කේ. බී. හේරත් වන මම මෙහි අයිතිය තබාගනිමි.

ශ්‍රී. බුධ. වර්‍ෂ. 2451

1909

# පෙරවදන

දශක කීපයක් මුළුල්ලේ සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රශස්ත ප්‍රකාශනයක් වූ 'සංඛ' සඟරාව මගින් සිංහල භාෂා – සාහිත්‍ය - කලා ක්ෂේත්‍රයට කළ මෙහෙවර විශිෂ්ට වූවකි. එය මේ සා මහත් මෙහෙවරට දායක වී ඇත්තේ 'ලිපි සංග්‍රහ' මෙන්ම පැරණි අප්‍රකට වැදගත් ග්‍රන්ථ යළි පළ කැරවීමෙන් ද වේ. එහි නවන් පියවරක් වශයෙන් දැනට දුලබ සාහිත්‍ය රචනා පස්වකයක් 'සංඛ' සඟරාවේ විශේෂ ප්‍රකාශනයක් වශයෙන් පළ කැරවීම මෙයින් සිදු වෙයි.

මේ ග්‍රන්ථ පස්වකයට අප්ටනාරි සන්දේශය ආරච්චි සන්දේශය. වැල්ලේ සන්දේශය. ශ්‍රී පාද ශතකය හා මහානාට්‍යාචාර්ය ජෝන් ද සිල්වා නිශ්ශුවරයෝ නම් ලේඛනය ද අයත් වේ. මේවා පිළිබඳව මෙහිලා සංක්ෂිප්ත ව හෝ හඳුන්වා දීම නවීන – ප්‍රවීණ පාඨක ලෝකයාහට වැඩදායක වෙතැයි සිතමි.

අප්ටනාරි සන්දේශය –

මේ කෘතිය සන්දේශයක් ලෙසින් නම් ගැන්වී තිබුණ ද එය නාම මාත්‍රයක් පමණි. මෙය පැරණි සම්භාව්‍ය සන්දේශාකෘතියෙන් ලියැවුණක් හෝ සන්දේශයක් රැගත් කෘතියක් හෝ නොවේ. අෂ්ටනාරි සන්දේශය වූකලි වන්දනා ගමන් මාර්ග වර්ණිත කාව්‍යයකි. මෙහි කාව්‍යයට නගා ඇත්තේ නාහගනේ ස්ත්‍රීන් අටදෙනකු මීගහකුඹුර පාරේ උයන්වත්තෙන් හඳපාන්ගම දෙවොලට පැමිණ කතරගම දෙවිඳුන්ගෙන් ශාන්තියක් යැදූ සිටීමේ සිද්ධියයි.

පද්‍ය 76 කින් සමන්විත මේ කාව්‍යය ආරම්භ කොට ඇත්තේ මෙසේය.

"සැරදෙ ළඳ අටදෙන – පෙළවන් පබව් දසනා
මියුරු සොඳ තෙපුලැති – ඇසූ දන සිතු රඳනා

මෙහි කාව්‍ය කතෘගේ නම අඥාතයි. දහනව වන සියවසේ මුල් කාලයට අයත් රචනාවක් සේ සැලකෙන මෙහි රචනා ශෛලිය හෙළිදරව් කරන්නේ මෙහි කතුවරයා සිංහල භාෂා සාහිත්‍යය පිළිබඳ සෑහෙන දැනුමක් ලබා සිටියකු බවයි. ඔහු විසින් පැරණි සම්භාව්‍ය කාව්‍ය ග්‍රන්ථ ඇසුරු කොට ඇති බවක් ද මේ කාව්‍යයේ ඇතැම් පද්‍යයකින් හෙළි වෙයි. අෂ්ටනාරි සන්දේශ කතුවරයාගේ කවි කුසලතාව වටහා ගත හැකි පද්‍යයක් දෙකක් නිදසුන් සේ පහත දැක්වේ.

"රහැස් නුවන් රතඹර නිල්ලා කෙතට
සිලැස් කසුන් වන හැඳ එල්ලා වමට
අදස්කමින් පිනිදිය ගල්ලා ලැමට
පසැස් මැදුර දැක වඳු වැල්ලා ගලට

(35 වන පද්‍යය)

"නොදන්නා බොලඳ ලිය කෙළිකවට අය
අදින්නා සළුව කුණු ඉහ වටට ලිය
එදන්නා කමට කුඹුකෙළි විදුලි සිය
මුදන්නා පොළත් පසුකර වෙලඳ ගිය

(39 වන පද්‍යය)

මේ කාව්‍යයේ දෙවැනි පද්‍යයේ දක්නට ලැබෙන"

"සොඳුරු කතුන් දැක පින් කළ බව හැඟුණි"

යන පද්‍ය පාදයත්, එසේම

මෙහි දහසය වැනි පද්‍යයේ දක්නට ලැබෙන

"ගිරිරද කඳ නා ලෝ මුල් කුරු සුබල"

යන පද්‍ය පාදයත් සිහියට නංවන්නේ කවියා සැලලිහිණි සංදේශයෙන් ලද අභාසයේ ජායාවකි.

ක්‍රි.ව. 1909 දී මුද්‍රිත මේ කෘතියේ පුරාණ අෂ්ටනාරි සන්දේශයයි යනුවෙන් දැක්වේ. අභිනව අෂ්ටනාරි සන්දේශයක් පැවති බවක් මෙයින් හැඟී යයි. එහෙත් එබඳු කෘතියක් පිළිබඳ දැනගන්නට නම් නැත.

අෂ්ටනාරි සන්දේශය රචනා කොට ඇත්තේ මේ අවධියේම රචිත යැයි සැලකෙන තවද වන්දනා ගමන් මාගී කාව්‍යයක් වූ "නාරීසත් සන්දේශය" අනුගමනය කරමිනැයි ඇතැම් විද්වත්හු පෙන්වා දෙති. නානගනේ ස්ත්‍රීන් සත්දෙනකු දඹුල විහාර වන්දනාවට ගිය පවත කාව්‍යයට නගා ඇති නාරීසත් සන්දේශය මැටිඹළුවේ සිල්පාධිපති ගණිතැඳුරු නම් වූ කවියකු විසින් රචිතයි. මේ කාව්‍ය කෘති දෙකේ

යම් යම් සමානකම් දැක්වෙන පද්‍ය දක්නට ලැබේ. පහත දැක්වෙනුයේ එක් නිදසුනකි.

"සීත ගිගුන් මල් විල් විණ නද අස ත
බීත නලින් ගුම්ගත් ගිරි කිදුරහ ත
ගීත බිගුන් බඹරද නදලා ගහ ත
නාතගනෙන් එන ලෙස සැරසුණු අහ ත

(නාරිසත් සන්දේශය 26 වන පද්‍යය)

"සීත කසුන් වත් හැඳ සැරයී සොබ ත
ගීත නදින් රහ කල සුරමෙන් ගම ත
දැන රනෙන් මුද්දර මිණි සිරි සිලි ත
නාත ගනෙන් එලිබැස අට දෙන අහ ත

(අෂ්ටනාරි සන්දේශය – 14 වන පද්‍යය)

අෂ්ටනාරි සන්දේශයේ භාෂාව ඇතැම් තැන දුර්බෝධය එසේ වූවද රසවත් පද්‍ය රාශියක් මෙහි දක්නට ලැබේ. සන්දේශ කාව්‍ය අතර නොව වන්දනා කාව්‍ය අතර මේ කුඩා කාව්‍ය සිත්ගන්නා කෘතියක් වෙයි.

ආරච්චි සන්දේශය –

ගම්මුලාදෑනින්ගේ නොපනත්කම් විස්තර කිරීම සඳහා රචිත සමාජ කාව්‍යයක් සේ හඳුන්වාදිය හැකි මේ කෘතිය 1921 වර්ෂයේදී ශ්‍රී කුමාර කිවියර විසින් සම්පාදිත වූවකි. මෙහි මුලින්ම "මානයික ගම්මුලාදෑනි කෙනකු විසින් ගම්මුලාදෑනින් පිළිබඳ කොම්පත් සභාවට ඔප්පු කරනු ලබන සන්දේශය" යි යනුවෙන් දක්වා ඇති හෙයින් මෙහි කෘති නාමය ආරූඪ නාමයක් සේ පෙනේ. මෙය කොළඹ ශ්‍රී භාරති මුද්‍රණාලයෙහි මුද්‍රණය කොට ඇත්තේ අම්බලන්ගොඩ රිචඩ් ද වාස් ගුණවර්ධනයන් විසිනි.

ආරච්චි සන්දේශයෙහි ඉංග්‍රීසියෙන් ලියන ලද පෙරවදනෙහි මෙසේ සඳහන් වේ.

"It is a well known fact that the misdeeds of the village Headmen of this country are daily on the increase and these men do more harm than good to their fellow villagers. This idea is supported by the fact that his Excellency the Governor in Legislative Council has deemed it necessory to appoint a Commission to inquire into the whole Headmen System with a view of battering it."

(Preface)

# අෂ්ටනාරී සන්දේසය

- (පූ රා ණ) -

1 සැරදෙ ලඳ අටදෙන පෙලවන් පබවදස නා
මියුරු සොඳ තෙපුලැති ඇසුදන සිතුරඳ නා

2 සො දු රු, නැණින්, තෙපලන පදරුත් සොඳි නී
ම හ රු, ගුණෙන්, යුතු උතුමන් විසඹ උ නී
තු නු රු, සිරෙන්, බබලනකපුන් රුවැ නී
සො දු රු, කතුන් දැක පින්කල බව හැඟු නී

3 සොඳු රු කතුනි තෙපි මගබැස එනකල ට
ම හ රු පුහුල් දැකලා බැස පෙරමග ට
සොඳු රු මොවුන් අත්ගෙන පියවෙමින් සි ට
නැඹු රු වෙලා නොවැලඳ ගතුද කර තු ට

4 මි යු රු වදන් ඇතිඅහනුන් සොඳ උව ණ
සොඳුරු වටොර රඹපැලයුරු සිළුටු ව ණ
ම හරු අහනො දැකදිත් රුපු පෙම් සිති ණ
ල ද රු අහනො තමයයි නොගතුද සැකෙ ණ

5 පැ හැ ස ර වන්, අහනුනි පියබස් දැනෙ න
ල ද ප ළු වන්. සුරතල් යුගපතුල් ගෙ න
මි හි න බ මින්, මගබැස එනකලසෙ මෙ න
පි ය ග ම නින්, දුක්නොව ආවෙද යෙහෙ න

6 ම න්. මදමන් සලෙල රතඹර සේ සිළු ව
පු න්. සඳයුත් අනහයුග දහලා බැළු ව
උ න්. දද කොත්යටග සැරපසලා සළු ව
ර න්. දද දුනුම්ට කතුනු ඉහලා සළු ව

7 වි ම ල යුගළුරුදන දිනුකපුන් මෙ තේ
නි ම ල තලපතුල් රත්තඹර පෙති මෙ තේ
තු මු ල වත අනහ යුදයට කලා මෙ තේ
කොම ල ලඳහනන් රුව කියනුබැරි අ තේ

8 අ බ ර ණ පැලඳ ජනෙලින් මුවපෙමා සතු
පි ඹ ර ණ රහගොසකර යන විදි අතු
අ බ ර ණ රිදී කොකවැල ගජ්ඇති නි මතු
ත ඹ ර ණ එමල් කැඩුමට රැවටුනයි ඇතු

9 ත ඹු, ලෙල කරවලා මල්දම් ගෙණ නොහැ රා
කු ඹු, කුල ඇතුලමින් මෙන් විදුලි එලි ක රා
ඇ ඹු, ලියවරල සිකිනිඳු ගෙල කරණ නු රා
බි ඹු, පලකියා දෙකොලට රැවටී රණ ගි රා

10 සු නි ක්, පියාසරසඳ සපිරි උවණ ට
කෙනෙක්, කියා නිමවනු බැරිය රුව දු ට
ම ද ක්, පියාසර කර හන්සකුඹුර ට
මැ නික්, කියා රැවටුනි උරඟු දෙනෙත ට

11 දැ ව වු නු දිවදුහුල කුනුඉහට සැර සි යා
නොවැටු නු යුග දෙකුඹුවල ලෙලෙන විදුලි යා
ගැ ව වු නු කම් කැළුම දිලිගිරහ ඇඹරි යා
රැ ව වු නු විදුද නොතම සුරඹ ලිය කි යා

12 ගි හි ණිය තරහතට සරිලන සුරත් නෙ ක
වි හි ලිය නොම කනෙක පුන්සඳවන් මෙනෙ ක
රැ හැ ණිය මන් සනෙක රණහස මනදොලෙ ක
ලි හි ණිය රැවටුනා වෙනි තනමඩල දැ ක

13 සල් සපුකැණට බමරණ රහන මෙලකු ණු
මල් දම කරට ලා මුතු බහණ පලඳි ණු
රැල් දිගුතලට, ගුරුළුන් පැමිණ රැවටු ණු
තිල් වරලෙසට රැවටී ආ බකමු ණු

14 බි ත කසුන් වත් හැඳසැරසී සොබ ණ
හී ත නදින් රහකල සුරමෙන් හම ණ
දැ ත රණෙන් මුද්දරමිණී සිරිසිලි ණ
නාත ගනෙන් එලිබැස අටදෙන අහ ණ

15 ලි ක්  දු නු ,රැ සතුරය රිකරන් ජනා වේ
දි ක්  ග නු  වක් නොහැර උදගම් මනා වේ
රොක් උනු  සෙන් සමග යන මන් සිනා වේ
නි ක් මු නු  ලඳහනෝ යෙති වන්දනා වේ

16 ගිරි රදකඳ නාලෝමුල් කුරු සුබ ල
සිරි මත් මෙනරලොව මිණි මුතු මල් උදු ල
පිරි සිරි එසුර පුරවන් දිද්දෙති දෙවො ල
පිරි ය සිතින් දෙව් මෙහසුන් හුතැස්බ ල

17 මහ මේ කුලවණ් මියුරැති නද දෙව ණ
කරන ලෙසින් අහනුන් මනතුටු සොබ ණ
තොප දෙන හසුන් පවසම් මියුරැති බසි ණ
තොප කන් යොමා දැන් අස මග යන ලකු ණ

18 ඉ  තා උදේ ඉරුදෙවිඳුගෙ එලිය දු ට
ඇ  තා ඇවිත් හැසිරෙන ඒ වෙලාව ට
සි  තා නැකත් මුවසිරිසය දිනිඳු දු ට
මෙ තා ගමන්කර මෙපුරෙන් කඩිනම ට

19 මියුරු සුවඳ පිරිකුඹු ඇ නොයෙක ප ල
කුමරු ලඳහනන් සහ මියුරැති කෙප ල
සෙමරු සමග සේසත් ගජ කෙදැති බ ල
සොඳුරු නිමිති බල පෙරමග විපුල ප ල

20 මැකුනු වල අඳුරු සරසඳ නරඹ බ ර
සකු නු රතදෙකුඹු විදුලිය මුකුළුක ර
ලකු නු රතදු දුලපෙති හල ලැමඳ තු ර
දකු  නු දිග බලව සකිසඳ සුමණ ගි ර

21 මුසුකර පවරන්ට ලැම ගෝමර අතු ර
අසුක ර පත් වරල බැදිමල් බිඟු මැදු ර
සෙසුපුර ලෙද අහණ සරිනොවණ ගැඹු ර
පසුක ර පුවඇවිත් ලඳ මීගහ කුඹු ර

22 ලිය ත් රොත්ත යන එන වැවුවිල් වල ට
නයන් නි  ත්ත රසදුන දෙනුවන් නිල ට
කියන් ඇ  ත්ත රණහසදී මල්විල ට
උයන් ව  ත්ත පසුකර බැස වල්පොල ට

23 ගැව්ය වෙරසුවඳ පිණිදිය කොඳ හම ණ
පැව්ය සඳැවන යුගදහ මිතිනඳ ණ
බාව්ය ලැමර තැහපෙති නිලඹර දෙත ත
යාව්ය ලඳලියෝ වල්පොල පසුකර ණ

24 තු ඩ රන් තඹරපෙති පියයුරු බානු ත මා
මැ ඩ අත දිගුවරල බැදිමල් රේනු යො මා
දි ඩ කතමෝ සලෙල පිණිදිය ගානුනෙ මා
ක ඩ වත කැලේ පසුකර යනවාළු ල මා

25 නි ල්ලා දිගු වරල බැදි මල් කොඳ සොඳු ර
ලොල්ලා වත සලෙල රතඹරසේ සොඳු ර
දූ ල්ලා දල කමල සඳවෙනි බිහු අඳු ර
කොල්ලැ ගලට බැස වඳු පස් ඇස් මැදු ර

26 ස ල් සපු කින අඹ දොඹ මී අඹ පලො ලී
දෙල් මොර කැන්ද සුවිසල් සොඳ නා මිදෙ ලී
තල් කිතුලින්ද පොල් පුවකිහු එසලි ම ලී
මල් කැල බරින් සැදිතුරු කැල බලනු ලො ලී

27 මුනිඳු අපා බුදුවී වැඩසිටි අයූ රු
පසි දූ ඉතා කරනෙව් බෝමුල සොඳු රු
සුසැදූ අපා මුනිවරු දැක ගොස් සොඳු රු
නමඳු ලදා සිහිකර නවගුණ මතු රු

28 වටු සැටි පටු නලල දිසිමුතු ලා බෙ ල්ල
තුටු මිටි රන් තඹර කුඹුතුරු ගැවි ල්ල
දුමු සිටි සඳ සලෙල කරවට ලා නැ ල්ල
බටු පිටි ගමින් යනලද අහනෝ ගො ල්ල

29 නැ ල්ල පුරාලා කරලා පොට දෙපො ට
බෙල් ල තුරා රණහසකුඹු පෙති පෙල ට
දූ ල්ල සළු සහල් ඇඳ නිලඹර රහ ට
ගොල්ල ලියෝ ගොස්වෙනි රත්දෙති වෙල ට

30 රි ලා වන් වඳුරු උකු බස්සා උ න්ද
බ ලා කැන් බුරණ රුදු බළු දිය න්ද
මෙලා කැකරණමුව කැස්සා උ න්ද
බ ලා පන් මිතුරෙ යද්දෙස්සා ක න්ද

31 දුවුදන සිත් පිනවණ තුරු පෙලින් සැ ද
ඉවුවන ලෙසින් ගියවුන් මන කොඳ පුබු ද
තුටුවන තුරින් බබලන හෙල ගිර සබ ද
දුවුදන සිත් අදනට හැකි මා සබ ද

32 ක තු ර දිතුතුන්ධරණරත්නක ඵැ ඇ න් ද
ය තු ර කරහතින් දිවිකුළු පොළු හ න් ද
අ ත ර තුර රහත කොකවැල දිලි කු න් ද
සොඳුර බල ඉඳුරු දිග දිලි දොළු ක න් ද

33 පෙ ර විදූ දැහැමි රජදරුවෝ සිත් තුටි න
ප ර වැඩ නොව තම වැඩ මෙන් කර තිබෙ න
දු ර නොව අසල පින් සලකන දන සිටි න
ක ර පිණිපා යව් නවගුණ සිහිකර න

34 ගන්නන් සළු වැලඳ බඳමුතු ගෙන් න න් හ
යන්නන් සිලිකෙලින කුඹු තුරු කොත් නැ න් හ
වන්නන් මුතු දෙපෙල දලරතරත් තැ න් හ
යන්නන් ලියො පසු කර දුනුපත් අ න් හ

35 ර තැ ස් නු ව න් රතඹර නිල්ලා කෙත ට
සි ලැ ස් ක පු න් වත හැඳ එල්ලා වම ට
අ ද ස් ක මි න් පිණිදිය ගල්ලා ලැම ට
ප සැ ස් මැ දු ර දැකවදු වැල්ලා ගල ට

36 ලො ල් ලා වත සොම්පුල්ලා ලඳ ලැම තැ ල්ල
තෙ ල් ලා ඉස පැ ට ලිල්ලා වරලස ගැවසි ල්ල
නි ල් ලා වත රැ ලි අල්ලා රණහස තැලවි ල්ල
වැ ල් ලා ග ල දැ ක පල්ලා අභණෙනි පුරන ල්ල

37 මු නි ඳු   ඉතා සුළු කුසිනාරා නුව   ර
ප සි ඳු   ඉතා කරනෙව් සල්තුරු අත   ර
දි නි ඳු   ලෙසා පිරිනිව් මුනි රු අයු   ර
නම ඳු   මෙතා සිහිකර අනිත පදස   ර

38 ම තු   වැඩ තකා වැද මැදුරින් නික්ම සි   ට
යු තු   මතු ගමන් ඇති පෙරමග බලා සි   ට
න තු   තෙවරක් කොට සකිසඳ බැස මහ   ට
ක තු   නි සැවොම යව් වෙහෙරින් නික්ම තු   ට

39 තොදන්නා   බොලඳ ලිය කෙලිකවට අ   ය
අ දි න් නා   සළුව තුනුඉහ වටට ලි   ය
එ ද න් නා   කමට කුඹුකෙලි විදුලි සි   ය
මු ද න් නා   පොලක් පසු කර මෙලඳ ගි   ය

40 ර   ල් ල ලා සළුව සිහි නිහ නි ල්   ල ලා
තෙ   ල් ල ලා බැඳපු නිල්වරල එල්   ල ලා
බෙ   ල් ල ලා එරන්දම කරතැල්   ල ලා
ලො   ල් ල ලා  කතුන් එහි දෙකුඹු සොල්   ල ලා

41 මා   ලා ලිත සුවිසාලා කුඹුසාලා රත්තෑ
දී   ලා ලඳ කරලාලා මුතුහරලාලා ආන   හ
ගා   ලා පිණිදිය පැලා කුඹු සරසා ලා ඒ ඇ   හ
මේ   ලා ගල දහලාලා එහි සරසාලා මේ ම   හ
හ

42 ගන්ජල   භා රැල නැ න් ගා මුහුලසයින් ගා බෝල
තුන් ගා   කො ඳ ර ණ ගා මුතුදදනැන්ගා මෙන් රත්ල   ද
පන් ගා   ඩම්නොවසන් ගා ලියනොවලන් ගා පැල   ද
රන් භා   ලිය කර නැන් භා කුඹුතුරු නැන් භා මේල   ද
ද

43 ස න් ඹා   රණ ලිය කම්ඹා  සළුහැඳ නත්  ඹා දැරූ
අ න් ඹා   නොමරති රන්ඹා  නෙත අතලන්  ඹා තැබ්බු   ව
ගැ න් ඹා   ලැම එකදන්  ඹා  කොදපෙති පෙම්ඹා තිබ්බු   ව
ර න් ඹා   ලිය නුබෙ කුන්ඹා  පියයුරු  බම් ඹා ඇම්බු   ව
ව

44 මු ඍු රු   සිපාගෙන පෙරට්ට සසොබා
අ ඍු රු   තෙලින් ඇදපෙති  සුඍුබල තෑ   ණ
අ ඍු රු   වලළු කුඩමසු මෙහි වැ ගා   ණ
ම ඍු රු   ඔය පසුව යන ලඳ අසමා   ණ

   ණ

45 ස එ ග ත දිඟුවරල බැදිමල් බිඟුපත ර
දි එ ර ත මදකුමුද බඳුපිය කුඹුලක ර
ක එ ර ක කුඹුකැකුල ගෝමරපෙති පත ර
අ එ ප ක ගම්වෙලෙන් යනලඳ බල මිතු ර

46 සො දු රු රුවැති කුමරුන් ඇකයෙහිම ත බා
මි යු රු හඬින් කියමින් කවිගී නොත බා
ම හ රු බැතින් පතිදන් පූරන සිත ත බා
සො දු රු රුවැති අහනුන් යන ගමන් සු බා

47 නි ල් මේකුලෙව් වරලස උනමින් දිග ට
ඇ ල් මෙසිතින් සලෙළුන් දෙස විවින් වි ට
බැ එ මි ළමින් සිටි ඒ වරඟනන් හ ට
බැ එ මි එවොත් බඹසරවත් කැඩෙයි දු ට

48 සො දු රු රුවින් දිසි පුන්සඳවන් වතැ කි
නි යු නු නැණින් පවසන සොඳකතා ඇ කි
මි යු රු හඬින් ගීතුති කව් කියන නි කි
ල ද රු උමාවන් රූ ඇති අඟණ යෙ කි

49 පු ල් ර න් ව න් ළැමද දිලිමුතුහර බහ ත
කැ ල් මෙන් සදිසි තනරණහස මුරුනග ත
ම ල් කැන් බොලඳකත යුගදඟ මෙන් ඉහ ත
වි ල් ග න් දෙමට වැව පසුකර යන අහ ත

50 එ ල එ වා ඇහට පෙතිකඹර සැලසූ නෝ
නි ල එ වා රතට සළුවැලඳ දිලි සූ නෝ
ව ල එ ලා යුගත සිරිසිලි නද නැළු නෝ
බ ල එ වා අගාරෙන් යෙති එලඳ ඟ නෝ

51 ඉ ස් සෝ ළැමද පෙතිගෝමර ලදුන් නේ
වි ස් සෝ පයෙන් ලඳහන පින්කරන් නේ
උ ස් සෝ පියාසර කරණාලෙසි නේ
නි ස් සෝ වෙලට එපිටින්ගම යොනුන් නේ

52 ස කි සඳ තොපි ගොස් සිට ඒගමට වැ ද
හැකි ලෙසකින් තම කිසකර යව් සබ ද
ම කි යන ලෙසින් ඒගම වැදතොසිට තො ද
ස කි ලිය අනේ යව යොන්ගම පසුව ඉ ද

53 සි ර්රු බෙල්ල කරවට රත් කොඳෙ ක ත මා
ගෝර්රු ඇල්ල පිණිදිය රන්බඳෙක ත මා
මා රු ලොල්ල පිරිසිදු කකසේම නු මා
සේ රු ගොල්ල පසුකරයනවාලු ල මා

54 පු ර හ න ව න් රු ඇති අහනන් විසි ත
පු මදුර ලෙසින් දෙන ඔවදන් සිතට ගෙ ත
ද ල සි එ ව ත් නෙත් සහලින් බැළුම් ල ත
ස ම ර ලෙ සින් සිටි තරුනන් හැරෙවි යි ත

55 ප ව ර බැ න් ද ගිරිසිළුතුරු නගර ව ර
ක ව ර කි න් ද ගිරිකුළු නදඅහන ව ර
මෙ ව ර කි න්ද ගිරිකුලෙ මුනිදක නව ර
නු ව ර ක න් ද බල සඳ නැගෙනහිරගි ර

56 මු රු කැලවසන තුරුපෙල සදිසිවන් එයි ත
තු රු දෙසබලා මනතුටුකරමින් සොඳි ත
පු රු ව තමන් කටයුතු අනලස වෙමි ත
ම රු ගෙ අහනුන්ට සමවන් නොපි යමි ත

57 වි දු රු වලින් නිලඹර ජලසලා හෙ ණ
නොදුරු ඔවුන් තිතිනා නානනා යෙ ත
තු දු රු අහන කෙල කෙල යෙහි සිනා සෙ ත
දැ දු රු ඔයෙන් බස්නා ජල නනා යෙ ත

58 මෙ සේ සකිනි ඒ මග පසුකර යමි ත
කෙ සේ වුවත් එහි නොරැඳි යව් කල ණ
නො සේ සිනින් මා ඔවදන් සිත්තුලි ත
කෙ සේ වුවත් නොකරව බැහැර පියහ ත

59 සි රි ලකහන මතුයෙහි කෙලිනා සෙයි ණ
කි රි වන් පඬෙර සුබකුල උපන් සොඳහ ත
සි රි නෙක වොරැඳි දුටුවන් සිත් සතුටුව ත
සි රි කතවන් අහනුනි යව්නැග එයි ත

60 න ළ වැද සළුව තුනුඉහවට ඇත් ද ත මා
වි ළ මැද රත්තඹරපෙති මුවගින් ද පෙ මා
රැ ළ මැද සිඳුහමන සිසිමුව වින් ද ළ මා
වෙ ළ මැද අම්බලම බලසකි නින් ද ග මා

61 ම න ක ල් හෙරුවනෙහි බැහි සිතැති දන ව ර
සැ ම් ක ල් පැමිණ ගිමහැරුමට කලපව ර
ම න දූ ල් වන එමැදුර සිට ගිමන් හැ ර
තො පි ලොල් නොවී එතැනින් යව තව බැහැ ර

62 මෙ වු ල් දමවැලඳි ලඳ තුනුඹහ කොහෙ ම
අ වු ල් කරපු රන්දද දූනුම්ට මහි ම
ද වු ල් බෙර මොවුන් පෙරටුවයන කල ම
දි වු ල් වැවට මින් බටු අහනෝ තල ම

63 කැ න කැන හිදන ගීතුකි කියමින් රහ ණ
ල ද හ න රහ බලමින් සිත්තුටු වෙමි ණ
දැ න ම න තුටින් සවනත කරනෙවු කල ණ
ර හ දෙ න රහ බලමින් යව තවඑයි ණ

64 දු වු දන සිත් පොබකල සොඳ කමල් ව ත්
තුටු වෙයි දුටු දනන් තුනුරුසිරු රන් ව ත්
තුටු පහටුව සමරයුදයට එවුව මෙ ත්
දු වු වන් සිත් තුටුවෙයි අහනුන් රන් ව ත්

65 නි නි ප ල ග ත් මෙපියස පොල්තුරු රුස ය
න ල වැ ද ග ත් කල ලෙලදෙන සොඳ ලෙස ය
සොඳ දරුවන්ගත් අහනුන් සිටි ලෙස ය
කටමනරන්ගත් මෙන් දක්වයි පිරි ය

66 ඇ ඹු ල් වුනු වීරපළු මොරද දුටු ද නෝ
ඹු ඹු ල් ජල පතර පත්ගැඹුර නොනැමූ නෝ
තු මු ල් බඳ සපිරි තිල් සළුව ඇඹරු නෝ
කි ඹු ල් වාන ඔය පසුකරපු ලඳග නෝ

67 නෙකතුන් වෙර සුවඳ ලා ලා ලද සැ ම
මෙකතුන් තුසර මුව දිසිදිලි කා රැ ම
තකදොන් කුඹු ලෙලෙන විකසිත මෙන් සැ ම
දැ ක ප ත් මිතුරෙ මන්වෙලහද මාන් ග ම

68 මෙ සේ මෙමග යන කල අහනුනි සොබ න
වි සේ සයෙන් නැමදියයුතු තැන් හැදි න
තොසේ සිහින් වැඳපුදමින් යව එයි න
මෙ සේ ගොසින් මෙදෙවොල තිබෙන ගම දැ න

69 දූ වූ ව න්   සිත් පිනවන අභනුනි කල   ණ
කුටුවන්   සිහින් කොල්ලන් ගෙන සිපාමි   ණ
දූ වූ ව න්   නෙක් පියවන තරුණින් විසි   ණ
කැටුවන්   සෙයින් චිත් කුලහන සිපති ගෙ   ණ

70 ඇ ට ඹ   මී හ ඹ   අඹ දඹ කරඹද ඇස   තු
ම හ ඹ   ගි ර ඹ   ඇටරඹපල් මල් දිමු   තු
කොසඹ   කොලඹ   පේරද සුද්ද මල් ව   තු
හ ර ඹ   හ ර ඹ   තුරුපෙල සැදි උයන් ව   තු

71 සියබලයෙන් ලක් රකිනට බාර ගෙ   ණ
තමැතිසියන් ලකහණ සරසා සොඳි   ණ
කදිරදෙවින් චිත් පුද පඩුරු ගෙනෙ ති   ණ
අපසරයෙන් සුරවර බලනෙව් අහ   ණ

72 උමාවන්   අහාණ කඳකුමරු පෙරටුව   ට
පමාදැන්   නොවීගිය කටයුතු සොඳ   ට
සමාවෙන්   කියා ශැලකර දෙව්ඳු හ   ට
තමා දැන්   පුදව ගෙනගිය පත අත   ට

73 සි ය ප ත්   වැනි සරණ යුගතින් බබලම්   ණ
සිතනෙත්   ගුණැති සුරිඳුනි ඔබ සිය බෙලෙ   ණ
අ ප සි ත්   පිණහ ආසිරි යස ගුණ නුව   ණ
කර මෙත්   සිහින් මෙපවත් ගෙන දෙන් සොඳි   ණ

74 මෙහඳුන   කඳ කුමරහට සැලකර සොඳි   ණ
ව දි මි න   බැතින් තෙවිටක් ඇඳිලි බඳිමි   ණ
ද කි මි න   සුරිඳු පිරිවර මුරුකැල නෙති   ණ
කි ය මි න   අයදිමින් අහනුනි මෙම ලෙසි   ණ

75 මෙහි ඇති පවත්   සැම අදහස පෙමින් ගෙ   ණ
උ ද ය ට ප ප ත්   දිනිසුරු රැස් වැද එයි   ණ
පු බු දි න ප ත්   සේ නැ මිතුරු සමහි   ණ
තොප හට සෙත්   සිරි ලැබ පවතු සැම දි   ණ

76 බරම්   නැඹතලත් කුනුහිරු ඇ නොයෙ   ක
වරම්   සුගත් සහ තිසුලත් දෙවි නොයෙ   ක
සුදම්   සබාවෙහි විදුරත සහ අනෙ   ක
කරම්   සුබා සෙත් දී මට මුරු අනෙ   ක

෴ නිමි ෴